# ශාමාගේ

## ජීවත්වෙන්න තව එකපාරක් හුස්මක් ගන්න

අද ඔයාගේ ජීවිතේ මොකක්හරි


දුකක් කියලා දෙයක් තියෙනවානම් ඒ දුක පිටිපස්සේ

ඔයාගේ දෛවය නෙමේ

තියෙන්නේ ඔයාගේ ගොන්කම.

සියයට අනූනමයක්. එකක්

විතර ඔයාගේ දෛවයේ
නොලැබීම ඇති.



www.sinhalaelibrary.com

# කතාව අහන්න...

## ඕනනම් කියවන්න... නැත්නම් අල්ලලා දාන්න...



ඒත් ඔයා අද දුක් විඳින්නේ අර අනූනමය නිසා.

මෙකයි. ජීවත්වෙන්න අමාරුම තත්වයක් එනවානම් ජීවිතය අතාරින්න එපා. ජීවත්වෙන විදිහ අතැරලා දාන්න. ක්‍රමය වෙනස් කරන්න. මොකක්හරි හුස්ම ගන්න පොටක් පෑදෙයි. මම කියන දේ තේරෙනවද දන්නේ නෑ. ඒත් මේ කතාව කියවලා ඉවරවුණාම ඔයාට ඒක තේරෙයි.

කෙල්ලගේ නම ශ්‍යාමා. ඇත්තම කිව්වොත් කෙල්ල ලස්සනයි. මං හිතන්නේ ඇයට තිබුනේ අහිංසක ලස්සනක් නෙමෙ. නාගරික ලස්සනක්. ටිකක් විතර ශලනි තාරකා වගේ. ඇයට වඩා උසයි.

ශ්‍යාමා කියන්නේ කවුද කියලා සරලම වචනයෙන් හඳුන්වලා දෙන්න පුළුවන්. ඒක ගෑණු ළමයෙක් හඳුන්වන්න එච්චරම හොඳ වචනයක් නෙමේ. ඒත් ඇගේ ජීවිතය සම්බන්ධයෙන් ලෝකය කිව්වේ ඒ කතාව. මං ලේබල් විශ්වාස කරන්නේ නෑ. ඒත් මේ සමාජය කෙල්ලව එක පාහර තැනකට දක්කලා පස්සෙ ඇයට කිව්වේ..."අතින් අත යන හොඳ බඩුවක්" කියලයි. මම ඒකට එච්චර කැමති නෑ. ඒත් ඇත්ත කතාව ඒක. ඇය අතින් අතට යන කෙල්ලෙක් වුණා.

ශ්‍යාමා කියන්නේ ඇගේ ඇත්ත නම නෙමේ. මේ වෙලාවේ

මට ඇගේ ඇත්ත නම පාවිච්චි කරන්න බෑ. මුලින්ම ශ්‍යාමා ගැන මට කිව්වේ මගේ සමීප මිතුරෙක්.



"මේ කතාව උඹ විශ්වාස කරන එකක් නෑ... ඒත් ඒ කතාව ඇත්ත කතාවක්..."

මගේ මිතුරා මට කිව්වා.

ශ්‍යාමා කොළඹ ඇවිත් තිබුනේ දෙදාස් අට අවුරුද්දේ අග විතර. ඒ වෙද්දී ඇයට අවුරුදු විස්සයි. ඇය වානිජ අංශයෙන් උසස් පෙළ කරලා තිබුණා දියතලාවේ පාසලකින්. ඇය කොළඹ එන්න හදිස්සියේම තීරණය කරලා තිබුනේ ඇගේ මිතුරියකගේ ආරාධනාවක් උඩ.

"මගේ ඇල්බම් එකේ උඹේ ෆොටෝ එකක් තිබුණා... දවසක් අපේ බොස් ඒක බැලුවා... මගේ මේසේ උඩ තිබිලා... උඹව දැකලා අහනවා උඹ කවුද කියලා... නිකමට හිතෙනවානම් වරෙන් කොළඹ... බොස් පටස් ගාලා උඹට ජොබ් එකක් දෙයි... මෙතන ෂපාන් එකේ ඉන්න පුළුවන් කෙල්ලේ... උඹට කපලා හතළිහක් පඩි ගන්න පුළුවන්... මටත් පාළු නෑ..."

මේ ඒ ආරාධනාව. පස්සේ කාලෙක ඇගේ මිතුරිය කියලා තිබුණා එහෙම නොකියා ඉන්නයි තිබුනේ කියලා. ඒත් ජීවිතේ වෙච්ච අත් වැරදීමක් ආයේ කවදාවත් හදන්න බෑ. ඒක වෙලා ඉවරයි.

කොහොමහරි ශ්‍යාමා කොළඹ ආවා. ඒ දෙදාස් අට අවුරුද්දේ අග. බදුලු කෝච්චියෙන් කොළඹ ආපු ශ්‍යාමාව පිළිගත්තේ ඇගේ මිතුරියි. ඇය

www.sinhalaelibrary.com



කොටුව ස්ටේෂන් එකට ඇවිත් උන්නා.

"වෙල්කම් ටු කලම්බු..."

ඇගේ මිතුරිය ඇයව පිළිගත්තේ එහෙමයි. එදා රෑ ශ්‍යාමා උන්නේ ඇගේ මිතුරියගේ ඇනෙක්ස් එකේ. ඒක බොරැල්ල කිට්ටුව තිබූ පුංචි ඇනෙක්ස් එකක්. ගෙයක උඩ තට්ටුවක කාමරයක්.

එදා රාත්‍රිය ශ්‍යාමාට වෙනස්ම ආනන්දයක් ගෙන දෙන රැයක් වුණා. ඇගේ මිතුරිය වූ ජීවනී ඇය එදා රෑට කන්න ළඟ චයිනීස් එකකින් ෆ්‍රයිඩ් රයිස් ගෙනාවා. එදා කොළඹට මොර සූරන වැස්සක් වැටුණු සීතල රැයක්. එදා රෑ ශ්‍යාමා ජීවිතයේ ප්‍රථම වරට සැර මත්පැන් වල රහ බැලුවා. ඔවුන් බිව්වේ ජින්. පළවෙනි වීදුරුව ශ්‍යාමාට පොවන්න ජීවනීට ටිකක්

www.sinhalaelibrary.com




අමාරුවුණා.

"මාත් මුලින් බිව්වේ නෑ බං... මගේ බෝයි ෆ්‍රෙන්ඩ් කෙනෙක් උන්නා ෆයිව් ස්ටාර් එකක වර්ක් කරන.. එයා ස්ටුවඩ් කෙනෙක් එකේ රෙස්ටොරන්ට් එකක... කොල්ලා තමා මටත් පුරුදු කළේ... දැන් ඉඳලා හිටලා බොනවා... අනේ මන්දා ඇති දේකුත් නෑ... ඒත් මේ කොළඹ පාළුවෙන් ඉන්නකොට නිකන් චුට්ටක් බිව්වාම මොනවද වෙනවානම් තමා බං... ටිකක් බීලා බලපන්..."

ජීවනී එහෙමයි කිව්වේ. එදා ශ්‍යාමා වොඩ්කා වීදුරු දෙක තුනක්ම බිව්වා. පස්සේ දෙන්නම එකට බදාගෙන එදා ඒ පුංචි කාමරයේ ඇඳ උඩ නිදාගත්තා. යුවතියක් ලෙස ජීවිතයේ ආරක්ෂා කරගත යුතුවෙන්නේ කන්‍යාභාවය වගේ ජීව විද්‍යාත්මක පටලයක් පමණක් නෙමෙයි. ඊට වඩා ලස්සන දේවල් තියෙනවා. ඒත් ඒ රාත්‍රියේ ශ්‍යාමාට ඒ බොහෝ දේවල්වල පිවිතුරු බව නැතිවුණා. ඇගේම මිතුරියගේ අතින්.

කොළඹ එපාවෙන්න ලොකු හේතු තිබුණා. ඒත් නතරවෙන්න ඊටත් වඩා හේතු ජීවනී කෙල්ලට මවලා පෙන්නුවා. ඒවලින් ශ්‍යාමා මත්වෙලා ගියා.

"බොස් කිව්වා උඹව එක්කගෙන





www.sinhalalibrary.com

එන්න කියලා... රිසෙප්ෂනිස්ට් කෙනෙක් හෙට අනිද්දා යනවා... සමහරවිට උඹව ගනී ඒ පෝස්ට් එකට... ට්‍රාන්ස්පෝට් එක්ක..."

ජීවනී කිව්වා.

"සැලරි එක ජීවනී අක්කේ..."

ශ්‍යාමා ඇහුවා.

"උඹට කීයක්ද ඕන කියලා බොස් අහයි... ගාණ කියපන්... බොස් දෙයි... තිහක්වත් කියපන්... නැතුව එපා..."

ඉන්ටර්විව් එක තිබුනේ සඳුදා උදේක. කාමරයේ සීතල වැඩියි කියලා ඇයට හිතුණා. ශ්‍යාමා වෙව්ලන්න ගත්තා.



www.sinhalaelibrary.com



"ජීවනී එක්කද ශ්‍යාමා ඉන්නේ..."

"ඔ..ව් සර්..."

"හොඳ කෙල්ල... ඔයාට හරි ආදරෙයි..."

ශ්‍යාමා ඒ පෞද්ගලික ආයතනයේ පිළිගැනීමේ නිලධාරිනියක් ලෙස බැඳුනා. කෙල්ලට අඳින්න වුනේ සාරි. බොස්ගේ අතින් ඇයට සාරි හත අටක්ම ලැබුණා.

"ලස්සනට ඉන්න ඕන... මලක් වගේ..."

ඔහු කොච්චර කරුණාවන්තද කියලයි ශ්‍යාමාට හිතුනේ. ඒ කරුණාව ගොඩක් තදින් ඇයට දැනෙන්න ගත්තේ ඒ සති අන්තියේ කොළඹ ගෝල් ෆේස් හෝටලයේ ඉන්දියන් සාගරයට මුහුණ ලා තිබූ කාමරයේදියි. සේවකයන් සිය ගණනක් පාලනය කරන ආයතන හිමිකරු ඇගේ දෙපා පාමුල උන්නා. ජීවිතය මෙච්චර පුදුමද කියලා ඇයට හිතුණා.

දවස් ගෙවිලා ගියා. ශ්‍යාමා උන්නේ අලුත් මත්මත් බවකින්.

"උඹට අදවත් ටිකක් රූම් එකේ ඉන්න බැරිද කෙල්ලේ..."

ජීවනී අසරණව ඇසුවා.

"නෝ නෝ... නාමල් එනවා දැන්

www.sinhalaelibrary.com



මාව ගන්න... අද ඉන්ටකොන් එකට යන්නේ..."

ජීවනී හිනාවුනා. මේ මධුසමය හෙට අනිද්දා නිමාවෙනවා කියලා ඈය දැනගෙන උන්නා. මොකද මීට කලින් බොහෝ දෙනෙක් මේ පාරේ යනවා ජීවනී දැකලා තිබුනා.

"හොඳයි..."

ජීවනී හුල්ලලා වගේ කිව්වා. මේ වෙද්දී ශ්‍යාමා ගැන හැමදෙයක්ම ගෙදරට ආරංචි වෙලා තිබුණා. දවසක් ශ්‍යාමාගේ අම්මයි අප්පච්චියි ඇවිත් ඔෆිස් එකේ විසිටින් රූම් එකේ කෙල්ලගේ අත අල්ලගෙන ඇඬුවා.

"මට එන්න විදහක් නෑ... අම්මයි අප්පච්චියි යන්න..."

ඈය ඒ තරමටම අකාරුණික වුණා.


ජීවනී කිව්වත් වගේ වසන්තය නිමාවෙන ලකුණු පේන්න ගත්තා. නාමල් අලුත් සමනලියක් සමඟ සරන්න ගත්තා. ශ්‍යාමා වියරු වැටුණා.

"ශ්‍යා..මා කට පරිස්සම් කරගනින් තේරුණාද... නැත්නම් උඹෙ ලස්සන ඇක්ෂන් හෙට වෙද්දී ඉන්ටර්නෙට් එක පුරා යයි... හරි... මේ බලපන් බැල්ලී..."

නාමල් ඔහුගේ පරිගණකයෙන් ඇයට පෙන්වූ බොහෝ දේවල් දැකලා ඇගේ පපුව ඇවිලිලා ගියා. තමා ඒ තරමම අසික්කිත විදිහට ජීවත්වුනා කියලා ඇයට හිතාගන්න බැරිවුණා.

"ම..ට බොන්න ඕන..."

එදා ශ්‍යාමා කාමරයට ඇවිත් කිව්වේ එහෙම. ජීවනී කතානොකර උන්නා.



"උඹට ඇහුනද ජීවනී අක්කේ... මට බොන්න ඕන..."

ඇය කෑ ගහලා කිව්වා.

"හිටපන් ගෙනත් දෙන්නම්... උඹට බොන්න ඕනවෙනවා කියලා මම දන්නවා..."

"උඹනේ පුරුදු කළේ... දැන් ගෙනත් දීපන්..."

ජීවනී එදා ගෙනාවේ බ්‍රැන්ඩි බෝතලයක්. ගෙනත් එහෙමම ඇඳ උඩින් තැබුවා.

"බීපන්..."

ශ්‍යාමා එදා බීලා ගොඩක් ඇඬුවා.

"අඬන්න එපා කෙල්ලේ... උඹ ගැන මට දුකයි... ඒත් උඹ ළඟ මනුස්සකම් නෑ... උඹ මට මොනවද වෙන්නේ කියලාවත් බැලුවේ නෑ... උඹ ඉන්ටකොන් එකෙන් කන්න ගියා.... මම මොනවද කන්නේ කියලා නිකමට ඇහුවේ නෑ.... ඒක හොඳ නෑ කෙල්ලේ..."

"ම..ට ස..මා..ව..දෙ..න්..න පුළුවන්ද කියපන්... නැත්නම් මම මෙහෙමම යනවා... අ..ද රෑ..ම..."

ශ්‍යාමා ජීවනීට වැඳලා ඇහුවා. ජීවනී ඇගේ අතක් අල්ලාගත්තා.

"මම උඹට කොහොමත් ආදරෙයි..."

www.sinhalaelibrary.com

ශ්‍යාමා හිනාවුණා.

"අ..ද ඉඳලා මා..න්.."

ශ්‍යාමා කිව්වා.

"උඹ බයවෙන්න එපා... මේ කොළඹ තියෙන්නේ එක සෙල්ලමක්



නෙමේ... මේක සෙල්ලම් ලෝකයක්..."

ජීවනී ආදරෙන් කිව්වා. ශ්‍යාමාව පපුවට තුරුල් කරගෙන.

"මම උගෙන් ලක්ෂයක් ඉල්ලුවා... ඌ මට කම්පියුටරේ තියෙන මගේ නියුඩ් සීන්ස් පෙන්නුවා... බ..ල්..ලා..."


www.sinhalaelibrary.com

ජීවනී කතාකලේ නෑ. ඉන්පස්සේ උදාවුනේ අලුත් වසන්ත කාලයක්.

"පිරිමි හිතන්නේ උන් අපිව පාවිච්චි කරනවා කියලා... ඒත් පුළුවන්නම් උන්ව පාවිච්චියට ගනින්... ඒක තමා කරන්න ඕන..."


ජීවනී කියලා දුන්නා. එදා ඉඳලා ශ්‍යාමා ඒක ආගමක් වගේ ඇදහුවා. මොන දේ වුනත් ශ්‍යාමා ජීවනීට ආදරය කලා. ඒත් පිරිමින්ම පාවිච්චි කලා.දරුණු විට. කුරිරු විදිහට. අද්භූත විදිහට.

ඒක අගෝස්තු මාසයක ඇයට කොළඹ පෞද්ගලික රෝහලක



නවතින්න වුණා. ඒ නීති විරෝධී ගබ්සාවක් කරන්න. ඒ ගබ්සාවේදී ඇයට අසාමාන්‍ය ලෙස අමාරුවුණා. ප්‍රතිඵලය වුනේ ශ්‍යාමා අසාමාන්‍ය ලෙස ගිලන් වීම. ඇයට හඳුනාගන්න බැරි රෝගයක් හැදිලා කියලා වෛද්‍යවරු නිගමනය කළා. ඒක සමාජ රෝගයක් කියලා

ඔවුන් අනුමාන කළා. වෛද්‍යවරු ඇයව අතිශය පෞද්ගලික ලෙස පරීක්ෂා කලා.



"ඔයාට සනීප වෙන්න පුළුවන් වෙයි... ඒත් සෑහෙන කාලයක් යයි... මේක ඔයාගේ රහස් ප්‍රදේශය පුරාම විසිරිච්ච රෝගයක්... ඒනිසා අවුරුද්දකටවත් ඔයාට ලිංගික දේවල්වලින් අයින් වෙලා ඉන්න වෙනවා... ඒ වගේම සෑහෙන පරිස්සම් වෙන්න වෙනවා... ගොඩක් බෙහෙත් බොන්නත් වෙනවා..."

ඒක අසාමාන්‍ය තත්වයක් වුණා. වෛද්‍යවරුන් මේ සියල්ලම ජීවනීටත් කිව්වා. පළවෙනි සතියේ ප්‍රතිකාරවලින් පස්සේ ශ්‍යාමා ඇනෙක්ස් එකට ආවා. එදා හවස ජීවනී හදිස්සියේම ඇඳුම් අස්කරමින් උන්නා.

"මේ ඇ..යි ජීවනී අ..ක්..කේ..."

"මේ ඇ..නෙ..ක්..ස් එක හෙට බාරදෙන්න වෙනවා කෙල්ලේ... මාත් මේ පුංචිලගේ ගෙදර යන්න කියලා මාලබෙ... උඹට අද ඉන්න පුළුවන්...ඒත් හෙට යන්න වෙනවා..."



"ම..ම එ..න..කො..ට..."

ජීවනි මෙලෙස තමාගෙන් වෙන්වෙන්නේ ඇයි කියලා ශ්‍යාමා දැනගෙන උන්නා.

"ඒක එ..හෙ..ම බෝ..වෙ..න්..නේ නෑ ජී..ව..නි අක්කේ..."

"මට නවතින්න විදිහක් නෑ ශ්‍යාමා... මම යන්න ඕන..."

එපමණයි. විකතින් ත්‍රී වීල් එකක් ගෙනවිත් ජීවනී ඇනෙක්ස් එකෙන් ගියා. තට්ට තනියම එදා ශ්‍යාමා ඇනෙක්ස් එකේ ඉඳගෙන කල්පනා කළා. ඇයට එදා රෑ අධික රුධිර වහනයක් සිද්ධවුණා. ඇය ගොඩක් දෙනෙක්ට කතාකළා. ඒත් ඒ වෙද්දී හැමකෙනෙක්ම ශ්‍යාමාගේ තත්වය ගැන දැනෙගන උන්නා.

"ඇයි මං කෝල් කලාම කවුරුවත් ගන්නේ නැත්තේ..."

ශ්‍යාමා බොහෝ දේවල් තේරුම් ගත්තා. ඇය පාන්දර පහට ඇඳුම් ටික ලෑස්ති කරගත්තා. ඇය ජීවනීට කතාකළා. ඒත් ඇගේ දුරකථනය ක්‍රියා විරහිත කරලා තිබුණා. ඒ වෙද්දී ඇගේ අතේ ලොකු මුදලක් තිබුනෙත් නෑ.

"ඒක බෙහෙත් වලටත් මදිනේ..."

ශ්‍යාමාට කරන්න කිසිවක් තිබුණේ නෑ. ඇය ඇඳුම් ටික ලෑස්තිකරගත්තා. ඇඳුම් අතරේ තිබ් උපත් පාලන උපකරණ... ගැබ්ගැනීම වලක්වන පෙති ඒවා විසිරී ගියා. ශ්‍යාමාට මොකක්ද අපුලක් දැනුනා. "මම ආයෙත් ඔයාට කියනවා... නෝ සෙක්ස්... ඔකේ..." වෛද්‍යවරයා කියූ දේවල් ඇයට දෝංකාර දෙන්න වුණා.

"නිදියගත්ත එක බල්ලෙක්ගෙන් මට හැදෙන්න ඇති... මොන බල්ලගෙන්ද කියලා දැන් කොහොමද හොයන්නේ..."

ඇය කේන්තියෙන් කිව්වා.



www.sinhalaelibrary.com



මාස ගාණකට පස්සේ ශ්‍යාමා අප්පච්චිට කතාකළා. ඇයව වෙව්ලනවා වගේ ඇයට දැනුණා. අධික උණකින් ඇය පෙළුනා. සමහර විට දියතලාවට යන්න කලින් තමාව මැරෙයි කියලත් ශ්‍යාමාට හිතුණා.

"අප්පච්චි ම..ම..."

ඇය අඬමින් වගේ කතාකළේ.

"ම..ට සනීප නෑ අප්පච්චි..."

"පො..චි දුව.. මොකද වුනේ... කොහෙද ඔය ඉන්නේ..."

දෙමව්පියෝ කියන්නේ දෙවිවරු කියලා ඇය තේරුම් ගත්තේ එදයි. ඒත් මෙච්චර කාලයක් දෙවියෝ කිව්වේ කාටද...?

"මම මේ කො..ටු..ව ස්ටේෂන් එ..කේ අප්පච්චි... එ..න..කො..ට දහය විතර වෙයි..ස්..ටේ..ෂ..න් එකට එනවද අප්පච්චි... ම..ට ටිකක් අමාරුයි..."

එච්චරයි. එදා දියතලාව දුම්රිය නැවතුමෙන් කෙල්ල බහිද්දී රෑ එකොළහයි. අප්පච්චි ඇවිත් කෙල්ලගේ අතින් අල්ලාගත්තා.

www.sinhalaelibrary.com

"මං පුනෙත් පුතාගේ වෑන් එකෙන් ආවෙ... ය..න්



මැණික..."

අප්පච්චි කෙල්ලගේ අතින් අල්ලගෙන එච්චරයි කිව්වේ.

"අනේ දෙයියනේ සහලෝල උණනේ මැණික..."

"ඔ..ව් අප්පච්චි..."

"යන් යන්... අපි බෙහෙත් ටිකක් අරන්ම යන්ද මැණික.."

"මං ගා..ව බෙ..හෙ..ත් තියෙනවා අප්පච්චි..."

එදා පුදුමාකාර දවසක්. දියතලාවට හරි සීතලක් ආපු දවසක්.

"එන්න නංගී... මෙ සීට් එකට නගින්න..."

ඇය වාහනයට පවා ගොඩවුනේ අමාරුවෙන්.

"නංගිට ටිකක් අමාරුයි වගේනේ ලොකු මාමා..."

"ඒකනේ පුතේ... බෙහෙත් ළඟ තියෙනවා කියන්නේ..."

www.sinhalaelibrary.com



එදා රෑ කෙල්ල අම්මව බදාගෙන ගොඩක් ඇඬුවා. අම්මත් ඇඬුවා. මල්ලිත් ඇඬුවා. ඒත් අප්පච්චි ඇඬුවේ නැහැ.

"කෙල්ලට කන්න පුළුවන් දෙයක් හදලා ගන්න දූලගේ අම්මෙ..."

එච්චරයි ඔහු කිව්වේ. එදා මහ රෑ අම්මා කෙල්ලට රස්නෙට කැකුළු බත් හදලා කරවල බැඳුමකුයි පරිප්පු තෙම්පරාදුවකුයි එක්ක කැව්වා... අම්මගේ අතින් බත් කටක් කන්නේ කාලෙකට පස්සේ නිසාදෝ ශ්‍යාමා බත් ටික කාගෙන කාගෙන ගියා.

"බෙහෙත් ටික මම දෙන්නද මැණික... බීලම නිදාගන්න.. අපි උදේට කතාකරමු..."

අම්මයි අප්පච්චියි කිව්වේ එහෙමයි.

අනිත් දවසේ උදේ පාන්දරම ඇයට ඇහැරුණා. ශ්‍යාමා නිවස ඉදිරිපිට ඉඳගෙන උස කන්ද දිහා



www.sinhalaelibrary.com

බලාගෙන උන්නා. මීදුම් කැටි ගැහුණු මේ කඳු දිහා බලාගෙන සෙල්ලම් කරපු ළමා විය ගැන ඇයට ආයෙත් සිහිවුණා.

"ම්... අප්පච්චි එළකිරි ගෙනත් උදෙන්ම... ඔයාට බොන්න කියලා..."

අම්මා රහට හදපු කිරි කහට වීදුරුවක් ගෙනත් කෙල්ලට දුන්නා.

"අ..ම්..මේ..."

ශ්‍යාමා කතාකළේ වෙනස්ම හඬකින්.

"පු..තේ..."

"මං අ..ම්..මේ ආයේ කොළඹ යන්නේ නෑ... ක..ව..දා..ව..ත් නෑ..."

ඇය අම්මාව බදාගෙනම ඇඬුවා. අම්මා මොනවත් කිව්වේ නෑ.

"උදේට කිරිබත් ටිකක් හදන්න.. කනවා නේද..."

"ම්... ක..ට..ට සම්බෝල ඇති..."

ශ්‍යාමා කිව්වා. ඇය සෑහෙන වෙලාවක් කන්ද දිහා බලාගෙන උන්නා.

"ඇයි උඹ මට කතාකරලා කොළඹ එන්න කිව්වේ ජීවනී අක්කේ... ඇයි..."

ඇය ඇහුවේ ජීවනීගෙන්.



සාමාන්‍ය තත්වයට එන්න ඇයට ගොඩක් දවස් ගියා. ඒ අතරවාරයේ ඇය අම්මටයි අප්පච්චිටයි හොරෙන් නුවර ගිහින් ඇගේ රෝගයට බෙහෙත් ගත්තා. ඉක්මනින්ම නැතත් ශ්‍යාමා සාමාන්‍ය වේගයකින් සනීප වුණා. ඒත් මේ රෝග තත්වය නිසා ඇයට තව අවුරුදු පහක් හයක් යනතුරු විවාහ වෙන්න එපා කියලා වෛද්‍යවරු නිර්දේශ කළා. විවාහ උනත් දරුවන් හදන්න එපා කියලයි ඇයට උපදෙස් දුන්නේ.

රෝගී තත්වය සාමාන්‍ය තත්වයට පත්වුනත් ශ්‍යාමාගේ මානසික තත්වය සාමාන්‍ය තත්වයට එන්න ටික කාලයක් ගියා. අසාමාන්‍ය ලෙස රාත්‍රී ජීවිතයක් ගතකළ ඇයට නින්ද යන්නේ නැති තත්වයක් ඇතිවුණා. නින්ද ගියත් භයානක සිහින දැකලා ඇය නින්දෙන් ඇහැරුණා. ඉන් පස්සේ ඇයට කොහොමටවත් නින්ද ගියේ නෑ.

ඇයට උදව් කරන්න උන්නේ අම්මත් අප්පච්චිත් විතරයි. ඒ දිනවල ශ්‍යාමා කළේ හැමදාම උදේටත් හවසටත් නිවසට පේන දියතලාව කන්ද දිහා බලාගෙන ඉන්න එක විතරයි. ජීවිතයට මේ උනේ මොකාද්ද කියලා ඇයට හිතාගන්න බැරිවුණා. සමහරවිට

www.sinhalaelibrary.com

ඉක්මනින් තමාව මැරෙයි කියලා ඇයට හිතුන දවස් පවා තිබුණා.

ඒත් එක දවසක ඇය තීරණයකට ආවා. ඒ අම්හිරි අතීත මතකයන්ට සදහටම සමුදෙනවා කියලා ශ්‍යාමා තීරණයක් ගත්තා. ඇයට ඒක කරන්න හරියටම අවුරුද්දක් ගතවුණා.



එදා දියතලාවට උදාවෙලා තිබුනේ හරි සීතල රාත්‍රියක්. ශ්‍යාමා උණුසුම් වතුර ටිකකින් ඇඟ සෝදාගෙන අලුත් ගවුමක් දාගත්තා. එදා ඇය ඇන්දේ ඇය ඉස්සරම දවස්වල, ඒ කියන්නේ ඇය කොළඹ යන්නත් පෙර ඇන්ද සාමාන්‍ය මෝස්තරයේ මල් ගවුමක්. අම්මා හවස බුදු පහන දල්වලා තිබුණා. ශ්‍යාමා ගිහින් හරි සැනසීමකින් බුදු පහනට වැඳලා ආවා. කෙල්ලගේ මුහුණ පුරා තිබුනේ මොකක්ද සනීප පාටක්.

"අ..ම්..මෙ..."

ඇය අම්මා ළඟට ගිහින් කතාකළා.

"පොඩි දුවේ..."

www.sinhalalibrary.com



"අප්පච්චි තාම නැතේ..."

"කඩේ වහලා එන්න එපැයි දරුවෝ... තනියමනේ හැමදෙයක්ම කරගන්නේ... අප්පච්චිටත් දැන් ටික ටික ලෙඩ... අපිට පෙන්නන්නේ නෑ..."

"ම්... මට තේරෙනවා..."

"කෝපි ටිකක් හදලා දෙන්නද..."

ශ්‍යාමා හිනාවුනා.

"පුළුවන්නම් ලොකු දෙයක්.."

ඇය අසරණව කිව්වා. අම්මා ඇයට උණුසුම් කෝපි කෝප්පයක් හදලා දුන්නා. ශ්‍යාමා කෝපි එක බිව්වේ වෙනදා වගේ කන්ද දිහා බලාගෙන හුල්ලමින් නෙමෙ. අප්පච්චිගේ පරණ වෑන් එක ඇවිත් මිදුලේ නතර කළා.

www.sinhalaelibrary.com



"පොඩි පුතේ..."

"අප්පච්චි අද රෑ වුණාද..."

"අද හාල් බාන දවස පුතේ... ටිකක් ඉන්න වුණා... සිංහල අවුරුදු කාලෙනේ එන්නේ... හාල් ටිකක් වැඩිපුර ගත්තා..."

මේ ගෙවෙන්නේ මොන මාසෙද කියලාවත් ඒ වෙද්දී ශ්‍යාමා දැනගෙන උන්නේ නෑ. තමා ජීවත්වුණා නෙමේ කියලා ඇයට තේරුණා. එදා අප්පච්චි වතුර ටිකක් දාගෙන කෝපි ටිකක් බොන්න එනතුරු ඇය බලාගෙන උන්නා. කෝපි කෝප්පයක් අරගෙන අප්පච්චි ඉඳගනිද්දී ශ්‍යාමාත් ගිහින් ඔහු ළඟ ඉඳගත්තා.

"අප්පච්චි..."

කෙල්ල මොනවද කියන්න යනවා කියලා අප්පච්චි තේරුම් ගත්තා.



"කියන්න පුතේ... මොනවද මගෙන් කෙරෙන්න ඕන..."

ශ්‍යාමාට පුදුම හිතුණා. දෙමව්පියන්ට දිවැස් තියෙනවද...?

"මට අප්පච්චිගෙන් උදව්වක් ඕන..."

"දෙමව්පියෝ දරුවන්ට උදව් කරන්නේ නෑ පුතේ... ජීවිතේම දෙනවා මිසක්... මොනවද ඔයාට කරලා ඕන... කියන්න..."

www.sinhalaelibrary.com



ශ්‍යාමා අප්පච්චි දිහා මොහොතක් බලාගෙන උන්නා.

"ම..ට හිතෙනවා අප්පච්චි ම..ම තව ටිකක් ඉගෙන ගත්තොත් හොඳයි කියලා..."

අප්පච්චිට ඉවසගන්න අමාරු සතුටක් දැනුණා. ඒ සතුට ඔහුගේ ඇස්වල ලස්සනට ඇඳිලා තිබුණා. කෙල්ල දවසක මෙතනට එනවා කියලත් ඔහු දැනගෙන උන්නා. දියතලාව ස්ටේෂන් එකෙන් කෙල්ලව ගත්ත මොහොතේ ඉඳලා මේ වනතුරු ඔහු වචනයක් වත් කෙල්ලට කිව්වේ නැත්තෙත් ඒ නිසා.

"ඔයා පුතේ ජීවත්වෙන්න ගත්තා කියලා හිතන්න... ඔයා හරි තැනට ආවා... ඒක ඔයා තනියෙන් ලබපු ජයග්‍රහණයක්... මම ඔයාට මගේ මුළු හදවතින්ම සුබ පතනවා... හැම කෙනෙක්ටම ජීවිතේ වැරදෙනවා... එකපාරක්... ඒක දෙපාරක් වරද්ද ගන්න එකයි නරක... කියන්න... මොනවද ඔයාට ඉගෙන ගන්න ඕන... කියක්ද ඔයාට ඕන... මම ඔයාගේ වෙඩින් එකට කියලා සල්ලි ටිකක් ඉතුරු කරලා තියෙනවා... ඒක ගන්න පුළුවන්... මම තව හම්බ කරනවනේ..."

අප්පච්චි කියද්දී ශ්‍යාමා ඔහුව බදාගත්තා. ඒක ඉවසගන්න අමාරු සෙනෙහසක්.

"ම..ම ඔයාට හරි ආදරෙයි අප්පච්චි... ම..ට සමාවෙන්න මගේ සුදු අප්පච්චි..."

කෙල්ල කෑ ගහලා ඇඬුවා. කොළඹ ඉඳලා ආපු දවසේ ඇඬුවටත් වඩා හයියෙන් ඇඬුවා.

www.sinhalaebook.com

"ලස්සනටම නැගිටින්නේ වැටිච්ච මිනිස්සු පොඩි පුතේ... මොනවද ඔයාට ඉගෙන ගන්න ඕන... කියන්න... මම වියදම් කරන්නම්..."

"ම..ට අප්පච්චි ලෝ...ය..ර් කෙනෙක් වෙන්න ඕන..."

මෙච්චර වැටිච්ච කෙල්ලෙක්ට එච්චර ගැඹුරු බලාපොරොත්තුවක්. අප්පච්චිට අදහාගන්න අමාරුවුණා. ඒත් ඔහුට තමන්ගේ දුව ගැන හරි ආඩම්බරයක් දැනුණා.

"අපි පටන් ගමු පුතේ..."

අප්පච්චී එපමණයි කිව්වේ.

අපේ ආදරණීය ශ්‍යාමා දැන් කොළඹ නීති විද්‍යාලයේ සිසුවියක්. තව වසර දෙකකින් ඇය නීතිවේදිනියක් ලෙස දිවුරනවා. මේ කතාව මට කිව්ව මගේ මිතුරා එක දෙයක් අවසානයේ මගෙන් ඇහුවා.


"උඹට හිතන්න පුළුවන්ද සූර්ව මේ කෙල්ල පල්ලමටම කඩාගෙන වැටිලා දියතලාවේ කඳු දිහා බලාගෙන ඉඳිද්දී හදිස්සියේම නැගිට්ටේ කොහොමද කියලා..."


ඔහු ඇහුවා. මට හිතාගන්න අමාරුවුණා.

"මොකක් නිසාද මචං..."

ඔහු මගේ කරට අතක් දාලා මගේ උරතලය හරි ආදරයෙන් පිරිමැද්දා.

"කෙල්ලව වෙනස් කළේ උඹ... උඹට විශ්වාස කරන්න පුළුවන්ද... මම දන්නේ නෑ කෙල්ල කියෙව්වේ උඹේ මොන නවකතාවද මොන ලිපියද කියලා... හැබැයි කෙල්ල හරි ආදරෙන් කියන්නේ පල්ලමටම වැටිච්ච මගේ ජීවිතේ ගොඩගත්තේ





සුජීව ප්‍රසන්න ආරච්චිගේ වචන කියලා... කෙල්ල උඹට දණගහලා වදින්න බලාගෙන ඉන්නවා... මම වෙලාවක ඔෆිස් එකට එක්කගෙන එන්නම්... උඹ මාරයි... මේ වගේ නන්නාඳුනන ජීවිත කීයක් උඹ ගොඩ අලා ඇන්ද... ඒ පින ඇති මචං... උඹ පන්සල් යන්න එපා..."

ඔහු එපමණයි කිව්වේ. කවදාවත් දැක්කේ නැති මේ නන්නාඳුනන නැගණිය ගැන මට හරි ආදරයක් ඇතිවුණා. ඇයව දකින්න මට ආසාවක් ඇතිවුණා.

"උඹේ මේ වචන කෙල්ල කාමරේ මේසේ වීදුරුව යට ගහගෙන ඉන්නවා... මම ඇස්දෙකින් දැක්කා..."

"මොකක්ද..."

"දුෂ්කරම කාලයේදීත් නැගිටින්න පුළුවන් කියලා විශ්වාස කරන්න... කවදාවත් පරාජය විශ්වාස කරන්න එපා... දිනන්න පුළුවන්... දිනන්න පුළුවන් කියලා විශ්වාස කරන අයට විතරයි... විශ්වාස කරන්න... ඔයාව... වෙන කාටවත් නෙමේ... ජයග්‍රහණය තියෙන්නේ එතනයි..."

නිමි

**සුජීව ප්‍රසන්න ආරච්චි ලියයි.**